**දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2018.**

-------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි ණය ගිවිසුම් අංක 5417(එල්කේ) දරන ණය ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

---------------------------------------------------------------------------------------------

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දේශගුණික අවධානම් ඇති විය හැකි ජනතාව හා වත්කම් අනතුරු වලට භාජනය වීම අඩුකිරීම සහ ආපදාවලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 14, 617 කට සමාන ඩොලර් මිලියන 111.8 ක් වන අතර ඉන් රු. මිලියන 14,382 කට සමාන ඩොල මිලියන 110 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමටට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2020 ජූනි 30 වන විට විම කිරීමට නියමිතය.

**1.3 මතය**

**------**

වැඩසටහනෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘති අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව හා වරින් වර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ව්‍යාපෘතියේ ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් හා වාර්තා පවත්වා ගැනිම අවශ්‍ය වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික ප්‍රගතිය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ආර්ථිකයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ද්‍රෝණි ආයෝජන සැලසුම් සංවර්ධනය, දේශගුණික අවබලපෑම් අවම කිරීමේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහය ලබාදීම සහ හදිසි අසම්භාව්‍යයන්ට ප්‍රතිචාර දැක්වීම යන ප්‍රධාන සංරචක 4 කින් සමන්විත විය. ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය පිලිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ද්‍රෝණි ආයෝජන සැලැස්ම සංවර්ධනය, ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීම හා හදිසි අසම්භව්‍යාන්ට ප්‍රතිචාර දැක්වීම යන සංරචකයන් යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල 2018 දෙසැම්බර් 31 දින වන විට ආරම්භකල දින සිට මාස 53 ක් ගත වීමෙන් පසුවද භෞතික ප්‍රගතිය සියයට 55 සිට සියයට 72 ක් දක්වා අඩු මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට හා පිරිවැය වැඩිවීමට හැකිය. | නිසි ලෙස අදහස් දක්වා නැත. | අමතර කාලය හා පිරිවැය වලක්වා ගැනීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

### 2.2 වැඩබිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුනු

**පහත සඳහන් කරුනු නිරීක්ෂණය විය.**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) මොණරාගල දිස්ත්‍රික්කයේ මුතුකණ්ඩිය ජලාශයේ ප්‍රධාන ඇල සංවර්ධනය කිරීමේ කටයුතු කොන්ත්‍රාත් පැකේජ් 2 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණු අතර ඇලේ පළමු කිලෝමීටර් 5 හේ සංවර්ධන කටයුතු කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකභාවය නිසා අඩක් අතහැර දමා තිබුණි. ඇලේ දෙවන කිලෝ මීටර් 5 හේ සංවර්ධන කටයුතු රුපියල් | පාර්ශව කරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන ඇපකරය අයකර ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. රුපියල් මිලියන 1.62 ක මුදලක් ඊලග කොන්ත්‍රාත්කරුගේ | කොන්ත්‍රාත් කළමනාකරණය පිලිබඳ පාලනය ශක්තිමත් කිරීම අවශ්‍යා වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | මිලියන 23.49 ක වියදමින් 2016 නොවැම්බර් 31 දින වන විට නිමකර තිබුණ අතර කොන්ත්‍රාත් වැඩවල දුර්වලතා හේතුවෙන් උඩුකුරු බිත්තියේ මීටර 30 ක් පමණ ඇලට වැටී ඇති බව 2017 ජනවාරි 26 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය. කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 දින වන විටත්, ඇලේ අදාල කොටස නැවත ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | | අවසාන ගෙවීමෙන් අඩුකරගෙන ඇත. | |
| (ආ) | මුතුකන්ඩිය ජලාශයේ අතු ඇලවල් සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 50.94 ක්වූ කොන්ත්‍රාත් පැකේජ් 3 ක් යටතේ ලබා දී තිබූ අතර එහි සංවර්ධන කටයුතු කොන්ත්‍රාත්කරුගේ අසාර්ථකත්වය හේතුවෙන් අත්හිටුවා තිබුණි. | -එම- | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන ඇපකරය අයකර ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. | -එම- |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ රුපියල් මිලියන 112.57 ක් පිරිවැය යටතේ ක්‍රියාත්මක වන හත්වතුනාඔය පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා දකුණු ඉවුර ඇලේ කිලෝ මීටර් 8+340 හි දියමංකඩ ඉදිකිරීම, ප්‍රධාන ඇලේ වම් ඉවුරෙහි කිලෝමීටර් 11+50 හි ආධාරක පවුරු ඉදි කිරීමට කොන්ත්‍රාත් 4 ක් පිරිනමා තිබුණු අතර 2019 ජුනි මාසයේ සිදුකල වැඩබිම් පරික්ෂාවේදී නොයෙක් අඩුපාඩු නිරීක්ෂණය විය. තවද බොරලු දුර්වල ලෙස සම්පිණ්ඩනය වීම හේතුවෙන් කිලෝමීටර් 0+05 කට කිලෝමීටර් 0+08 දක්වා කෘෂිකාර්මික මාර්ගවල යෝග්‍යතාව ප්‍රමිතියට අනුකූල නොවුණි. | -එම- | අවශ්‍ය ප්‍රමිතියට බොරලු සම්පිණ්ඩනය කර ඇති බවට තත්ත්ව සහතිකයක් ලබාදෙන මෙන් කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් ලබා දී ඇත. | තත්ත්ව පාලන සහතික සිදු කිරීම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. |

## 2.3 **ඌණ උපයෝජිත වත්කම්**

| **විගණන නිරීක්ෂණ** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|
| ඩොලර් මිලියන 110 සමාන රුපියල් මිලියන 14,383 ක් වූ මුළු | ඉතිරි මාස 18 ක කාලය තුල සියයට | ව්‍යාපෘති කටයුතු වැය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක | ව්‍යාපෘතිය යටතේ වෙන් කර ඇති |

| | | | |
|---|---|---|---|
| ප්‍රතිපාදනයෙන් සියයට 57.78 ක ප්‍රමාණයන් වූ රුපියල් මිලියන 9,470 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 63.56 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | 42.22 ක් නියෝජනය කරන රුපියල් මිලියන 4, 913 කට සමාන ඩොලර් මිලියන 46.44 ක් වූ ඉතිරි මුදල් ඉදිරි මාස 18 ක කාලපරිච්ඡේදය තුලදී භාවිතා කිරීමේ හැකියාව අවම මට්ටමක පවති. | කරන ආයතන සමග ඒකාබද්ධව පියවර ගෙන ඇත. | ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමට ඵලදායි පියවර ගත යුතුය.. |

**2.4 පද්ධති හා පාලනයන්**

---------------------

| **විගණන නිරීක්ෂණ** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|
| අභ්‍යන්තර විගනණ නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කමිටුවක් විසිනි එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වරයෙකු සහ ගණකාධිකාරවරයෙකු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක වරයෙකු, මාර්ග සංවර්ධන අධිකාරියේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ හා වාරිමාර්ග ජල සම්පත් සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන කමිටුවක් ව්‍යාපෘති අධ්‍යක්ෂ වරයා විසින් පත්කොට තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිලිබඳ ප්‍රමාණාත්මක සොයාගැනීම් හඳුනා හැකිවන පරිදි විස්තරාත්මක විමර්ශනයන් අදාල කමිටුව විසින් සිදුකොට නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අපොහොසත් වීම. | මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින බැවින් නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී වක්‍රලේඛ උපදෙස් පිලිපැදීම සටහන් කර ඇත. | ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිලිබඳ ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීමට නොහැකි වීම. |